


සිසිර දිසානායක

දවසින් දවස ඉහළට වැඩෙන උණ දල්ලක්, උණ ගහ මෝරන්න මෝරන්න පහළට නැවෙනවා. බුද්ධියෙන් දැනුමෙන් මුහුකුරා යන්නෙකු නිහතමානී වෙන්න ඕන කියලා කියන්නෙත් අන්න ඒ වගේ. ඒත් නිහතමානීකම නියාළුකමක් විදියට සැලකෙන ලෝකයකයි අද අපි ජීවත් වෙන්නේ.

මම ඔය විදියට ''ගී සඳළුව'' ලියුම පටන් ගත්තේ ''නිහතමානීකම'' කියන වටිනා ගුණය පිරී ඉතිරී ගිය ගීත ලෝකයේ ප්‍රවීණයෙකු මුණ ගැහෙන්නට පසුගිය දාක අපට ඉඩකඩ ලැබුණ නිසයි. ප්‍රවීණ සංගීතවේදී රෝහණ වීරසිංහගෙන් ඉල්ලා ගත්ත දුරකථන අංකයේ උදව්වෙන් අපි පාර හොයාගෙන ගියේ හෝමාගම බෙල්ලකපාපු හන්දියෙන් ඇතුලට ගියාම හමුවෙන මිහිඳු පෙදෙසේ නිවසකට. ඒ ප්‍රවීණ ගීත රචක, සංගීත නිර්මාණ හා ගායන ශිල්පී සෝමතිලක ජයමහ කලාකරුවාණන්ගේ නිවසයි. ගීත රචනය, තනු හා සංගීත නිර්මාණය, ගායනය කියන තුනම නිසියාකාරව කරන්නට පුලුවන් අයට ''වාග් ගේය කාර්'' නමින් හඳුන්වනවා. ඒ නමින් හඳුන්වන්න පුළුවන් මේ අගනා ශිල්පියා අප සමඟින් 'සන්නස' වෙනුවෙන් පිළිසඳරට එක්වුණේ කියන්න බැරි තරමේ ලෙන්ගතුකමකින්.

## නව දැලි හේනක

මුල් සිනාවෙන්ම ඒ ලෙන්ගතුකමත්, නිහතමානීකමත් උතුරා ගියා.

''ගීත කීපයක්ම තියෙනවා කතා කරන්න පුළුවන්. ඒත් අපි වෙලාවෙ හැටියට වැඩියෙන්ම දැනුණ ගීතය ගනිමු. නව දැලි හේනක ගීතය හොඳයි කියලා හිතෙනවා'' නිස්කලංක නිවහනේ ආලින්දය සෝමතිලකගේ තැන්පත් හඬින් අවදි වුණා.

''අපට පෙනෙන බාහිර රූපයට වැඩිය අපි හදවතින් අඳුනා ගන්නා රූපයයි අපට වැදගත් වෙන්නේ. මේක සමහරවිට හිතා ගන්නත් බැරි දෙයක්. විශේෂයෙන්ම ආදරය, විවාහය ගැන හිතන කොට මේ වගේ උදාහරණ කොයිතරම් තියෙනවද? කෙනෙකුගේ ඇවතුම් පැවතුම්වලට ඒවායේ තියෙන සිත් ඇද ගන්නා සුළු බවට බැඳෙන බැඳීම, බාහිරව දකින රූප සම්පත්තිය නිසා බැදෙන බැඳීමට වඩා ප්‍රබලයි කියල මම හිතන්නේ'' සෝමතිලකයන් ගීත රචනාවට පාදක වුණ නිමිත්ත දක්වමින් ගීයේ පසුබිම ගැන කතාව පටන් ගත්තා.

මේ රචනාවට පාදක වුණ හේතුවත් කියන්න ඕන. ඒ කාලේ මගේ මිත්‍රයෙක් හිටියා එකට වැඩ කරපු. ඒ කාලේ කියල කිව්වෙ අපි විවාහ වෙන්න එහෙම කලින් කාලේ. අපි බෝඩිං වෙලයි හිටියේ. දවසක් මේ මිත්‍රයාගේ ආරාධනාවක් පිළි අරගෙන එක සෙනසුරාදාවකමම ගියා එයත් එක්ක එයාගේ ගමේ ගෙදර. ගෙදර උන්නේ යාලුවයි අම්මයි විතරයි. ඉතින් දවල්ට කාලා රෑත් එහෙ ඉඳලාම එන්න කියලා. යාලුවගේ අම්මත් ඇවිටිලි කළ නිසා එහෙම කරන්න මාත් එකඟ වුණා. තමන්ට හිතූ දේ කරන්න පුළුවන් නිදහස් කාලයනේ ඒ.

දවල් කෑමට පස්සේ පොඩි නිදිමත ගතියකුත් ආව නිසා මම පිළිගන්නපු කාමරයේ ඇඳේ මං ඩිංගක් ඇල වුණා. යාලුවා ඔය අතරේ කොහේ හරි පිටට ගියා. ටික වෙලාවකින් යාලුවාගේ අම්මා කාමරයට ආවේ වැදගත් කතාවකට මුල පුරාගෙන.

''මගේ පුතාට යෝජනා ගණනාවක්ම තියෙනවා ළමයෝ. ඒ අය රූමත් අය. පෙළපත්වලටත් ගැලපෙනවා. දෑවැද්දට අක්කර දහයක් විතර, වාහන එහෙමත් දෙන්න කැමතියි. ඒත් මෙයා කැමති නෑනෙ.'' අම්මා මේ කියන්නෙ විවාහ යෝජනා ගැන. ඒ කාලෙ අක්කර දහයක් වාහනයක් දෑවැද්දට ලැබෙනවා කියන්නෙ ලොකු දෙයක්.

''ඉතින් ඕකට හේතුවකුත් තියෙනවා පුතේ. එයාට වෙන සම්බන්ධයක් තියෙනවා. ඔයා ඉතින් එයාගේ හොඳ යාළුවානේ බැරිද ඔය සම්බන්ධය කඩලා දෙන්න?'' අම්මා මේ ඉල්ලා හිටින්නේ යාලුවාගේ ආදර සම්බන්ධතාවය කඩලා දාන්න කියලයි.''

අපි ආපහු පස්සේ දවසක අම්මා මා එක්ක කිව්ව කතාව ඇත්තක්ද කියලා මං යාලුවාගෙන් ඇහුවා.

''මං ඇසුරු කරපු කෙල්ලක් ඉන්නවා. ඒකිව මට අමතක කරන්න බෑ.''
''කෙල්ල ලස්සනද?'' මං ඇහුවා.
''නෑ'' යාළුවා පස්සෙ දවසක ඒ ගෑණු ළමයව මට පෙන්නුවා.

සැබෑ නිර්මාණකරුවකුට විචක්ෂන බුද්ධියක් තියෙන්න ඕන. ඒ බුද්ධිය ලබා ගන්න පොතපතම ඕන කරන්නෙ නෑ. ඔහුට හරි ඇයට පුළුවන් අත්දැකීම්වලින් තමන්ගේ බුද්ධිය වඩවා ගන්න. ඒ අත්දැකීම් තමන්ගේම වෙන්න ඕනෙත් නෑ. අනුන්ගෙ අත්දැකීමක්, තමන් සමාජයෙන් ලබපු අත්දැකීමත් වුණාත් තමන්ගේ බවට හරවා ගන්න පුළුවන්. සෝමතිලකයන් ගේ ඒ ගුණය නෙවෙයිද මේ අත්දැකීමෙන් කියවෙන්නේ.

''ඔය හැත්තෑව දශකයේ අපි හත්අට දෙනෙක් එක බෝඩිමේ උන්නා. අවුරුදු නිවාඩුවට හැමෝටම වගේ ගම්වල යන්න අවසරය ලැබෙනවා. ඒත් එක අවුරුද්දක මට සිංහල අවුරුද්දට ගමට යන්න ලැබුණේ නෑ. මට සංගීතය උගන්වපු ඩී. ඩන්ස්ටන් ද සිල්වා මහත්තයා අවුරුදු ගීත වගයක් කරන්න මට ඉන්න කියලා තිබුණා. ගුවන්විදුලියේ පටිගත කිරීම්



නව දැලි හේනක පෑව වැදිරි රුව
ලෙස උවමින් දෙනුවන් රවටා
මා පෙම්කළ ජනපද කල්‍යාණිට
හිමියනි මට කළ නොහැක නිගා

සුරඟන රූ සිරු දුටිමි හැඳින්නෙමි
සිත් ලෙස දෙනුවන් බඳුන් පුරා
මා හඳුනන මගෙ හදගත් කලණිය
මට නුදුරුයි සුරඹුනට වඩා

මා සිත සුවපත් කරලනු නොහැකිය
සෝ ළතැවුල් දෙයි රැයද දිවා
නෙත දුටු සුරඟන රූ සිරු කුමටද
හද දුටු ජනපද කලණ මිසා

යෙදුන නිසා මට බෝඩිමේම ඉන්න වුණා. මං හිතන්නේ ඒ අප්‍රේල් 13, නැත්නම් 14 වෙන්න ඕන. බෝඩිම හරිම පාළුයි. මං ඉතින් ෂර්ට් එකත් දාගෙන නිකං බස්එකේ ගියා. නුගේගොඩ දිහාට යනකල් ගියත් එහෙත් පාලුයි. මං නුගේගොඩින් බැස්සා. ඔය වෙලාවෙ මට අර කලින් කියපු යාළුවාගේ තනිකම දැනුණා.

සැබෑ නිර්මාණකරුවකුට සංවේදී හදවතක් තියෙන්නට ඕන. තමන් පාළු පරිසරයක තනිවුණ වෙලාවක අනික් අයෙකුගේ පාළුව ගැන සංවේදී වෙලා හැඟීම් බරවුණ සෝමතිලකයන් ආපහු බෝඩිමට ඇවිත් පදරචනය පිරුවේ ඒ ගුණය අනූනව තිබූ නිසා නෙවෙයිද?

''අම්මා රූමත්, ධනවත් තරුණියන්, පෙන්වද්දී යාලුවාගේ ප්‍රේමය නවත්වන්න බැරි වුණේ හදවතින් බැදුණ බැම්ම නිසා නේද?'' සෝමතිලකයන් ඇහුවා.

''තේ ටිකක් බීලා ඉන්න'' සෝමතිලකයන්ගේ හද බැඳි ප්‍රිය බිරිඳ කැවිලි පෙවිලි බන්දේසියක් අතැතිව ආලින්දයට ආවේ ඒ වෙලාවේයි.
''නන්ද - ජනපද කල්‍යාණි කතා ප්‍රවෘත්තිය මේකට හොඳම අනුභූතිය නේද කියලා මට හිතුණා.'' සෝමතිලකයන් උණු තේ පැන් උගුරකින් දෙතොල තෙමන ගමන් කට හඬ අවදි කළා. තමන් ඇසූ පිරූ දේ නිර්මාණයකට එක්වෙන හැටියි ඒ. බෞද්ධ සාහිත්‍යයේ එන කරුණු පිළිබඳව දැනුම මේ විදියටයි ගීයට එක්වුණේ.
'නන්ද එක්කර ගෙන බුදුහාමුදුරුවෝ යද්දී ඉක්මණින් එන්න කියලා ජනපද කල්‍යාණිය කිව්වා. නියම කතාවේ හැටියට නම්, බුදු හාමුදුරුවෝ නන්දට දිව්‍යාංගනාවෝ පෙන්වලා එන ගමන් පෙන්වන්නේ අලුතින්ම කැලෑව කොටලා පිච්චුව අළුත් හේනක පිළිස්සුන වැඳිරියක්. ජනපද කල්‍යාණිය මේ අතරින් කවුරු වගේද කියලා ඇහුවම නන්ද කියන්නේ වැඳිරිය වගේ කියලයි. එහෙම නම්, සිල් රැක්කොත් දිව්‍යාංගනාව ලබා දෙන්නම් කියන පොරොන්දුවටයි නන්දව මහණ කෙරුණේ.

''මට ඕන කලා මේ කතාවට පිටින් ඒ කාලයේ තිබුණ පරිසරයෙන් යමක් ඉස්මතු කරලා නියම කතා වස්තුව කියන දේට වඩා අලුත් අදහසක් ලියන්න. ඒ කාලයේ හිටපු සමහර ස්වාමීන් වහන්සේලාට සිල් රැකලා ධ්‍යානයක් වඩවා ගන්න බැරි වුණ වෙලාවට අධෛර්ය වෙලා බුදුන් ගාවට කීප වතාවෙ ඇවිත් උපදෙස් ලබාගෙන ආපහු ගිය වග පොත්පත්වල මා කියවලා තියෙනවා. පොතපත ඇසුරින් ලැබූ දැනුම නිර්මාණයකට එක් වෙන හැටියි ඒ.

''ඉතින් නන්දටත් ඒ දේ එහෙම වුණා වෙන්න බැරිද? එතුවක් කල් ආදරය කරපු ජනපද කල්‍යාණිය එක්වරම අමතක කරන්නෙ කොහොමද? ඇය ගැන සිතමින් ඉන්න නිසා සිල් රකින්න බැරි වුණ අවස්ථාවක් මම මවා ගත්තා. හදවත ඇද බැඳගත් ජනපද කල්‍යාණිය සුරඹුන්ට වඩා මට නුදුරුයි කියලා නන්ද බුදුන්ට ඒ වාගේ අවස්ථාවක කියන්නට ඇති කියලා හිතුණා. මේක බෞද්ධ භාවිතයට ප්‍රතිවිද්ධ දෙයක්.'' සියල්ල එක්ව නිර්මාණකරුවකුගේ නිර්මාණශීලිත්වය නව නිර්මාණයක් එළිදැක්වීමට යෙදූ කදිම නිදසුනකි මේ.

ගීයේ තනුව, සංගීතය, ගායනය ගැන තවත් පිටු ගණනක් වුණත් ලියන්නට පුලුවන්. එයට ඉඩකඩක් නැති වුණත් ළඟකදී කෙරෙන්නට සැළසුම් කරන ඕස්ට්‍රේලියානු සංචාරය ගැන වචනයක් කතා කරන්නටද අපි අමතක කළේ නෑ.

''ඇත්තටම මගේ මුල්ම විදේශ සංචාරයයි ඕස්ට්‍රේලියානු සංචාරය. විදේශ රටවල විතරක් නෙවෙයි ලංකාවේ පවා ප්‍රසංගවලට සහභාගිවීම මම නැවැත්තුවේ මුල් කාලයේදීමයි. ඒකට හේතුව ඝෝෂාකාරී සංගීතයත් එක්ක ගීත කියන්න ගියාම මගේ හඬ යටපත් වෙනවා. මුල ඉඳලම මම මගේ කටහඬ පුහුණු කර ගත්තේ යම්කිසි පිළිවෙලකට සකස් වුණ සංගීත ක්‍රමයකට. ඒ නිසා මගේ ගායනාවලට සංගීතය සපයන්නෙ කවුද, මොන භාණ්ඩවලින්ද කියන එක ගැන මම හරිම සැළකිලිමත්. ඇත්තටම රෝහණගේ බලවත් ඉල්ලීමටයි මම මේ සංචාරයට එකඟ වුණේ. ඉතින් එහෙම බලන කොට මෙල්බර්න් ප්‍රසංගයේදී තමයි මගේ විදේශයක ගැයෙන මුල්ම ගායනාව කෙරෙන්නේ.''

රෝහණ වීරසිංහයන්ගේ සංගීත මෙහෙයුමින් යුතුව ඔක්තෝබර් 14 දින සවස 5 ට මොනෑෂ් සරසවියේ රොබර්ට් බලැක්වුඩ් ශාලාවේදීත්, ඔක්තෝබර් මස 20 වන දින සවස 5 ට සිඩ්නි පැරමටා හි වෙස්ටර්න් සිඩ්නි විද්‍යාලයේදීත් ප්‍රසංග ගතවන ''සරස වසන්තය'' ගැනයි සෝමතිලකයන් ඒ මතක් කළේ.

ඉතාම සෞම්‍යව, තැන්පත් කමින් යුක්තව ගැයෙන තම හඬ කිසිවිටෙක මුදලට පාවා නොදුන් සෝමතිලක ජයමහ කලාකරුවාණන්ගේ අදහස් නිහතමානී මෙන්ම අදීන වෙනවා. වීරරසිංහයන් සමඟින් පැමිණෙන වාද්‍යශිල්පීන් හා එක් වෙන්නට නියමිත කැමරන් කොළඹගේ මූලික වුණ ''තරංගා'' වාදන කණ්ඩායමට එය අභියෝගයක් වෙන එකත් නැති වේවි.

දුරකථන සාකච්ඡාවක් වෙන්නට තිබුණ මේ පිළිසඳර සම්මුඛ සාකච්ඡාවක් කරවන්නට උනන්දු වුණ මාර්ග සංවර්ධන අධිකාරියේ අවිස්සාවේල්ල විධායක ඉංජිනේරු කොට්ඨාශයේ ජයලත් හා ප්‍රසන්න රසික සහෘදයන්ට ස්තූති කරන්නටත් ''ගී සඳලුව'' අග ඉඩක් ඉතිරි කර ගන්නවා. ■

## රණබිමේ පුතුට



සඳකැන් ගලා තුරුලිය ගොමු නැහැවෙද්දී
කොඳකැන් රිදී විල් දිය මත හිනැහෙද්දී
හදවත් වෙසක් සිරියෙන් විකසිත වෙද්දී
පුතු බිහි වුණා මවකට නව දිවියත් දී

නිල්මිණි නුවන් පොබයා බලමින් අවට
මල්පෙති දෙතොල් විහිදා කිරිකැටි මුවට
රන්කැටි සිනාවට මුළුගැන්නී නිවට
රන් තරු පැරැදුණා මගෙ පුතුගේ රුවට

දණ ගා නැගී සිට පියවර ඔසවද්දී
කළ දඟකාරකම් යළි සිහියට එද්දී
අමතක කළ හැකිද කිරි ඉල්ලුව සිද්දී
කිරි සුවඳමයි තවමත් මුව සිප ගද්දී

ගහකොළ කුරුල්ලන් හා බලි මුහුණු ඇඳ
පොඩිවුන් කෙළින විට මහගෙයි මිදුල මැද
රණ අවි ගැටුම් බහ තෝරන වියෙදි ඇඳ
පුතු ගොළු බසින් කී දෙය වැටහුණේ අද

යුතුකම් අයුතුකම් දැන දහමට නතුව
ළමයකු නොවේ වැඩිහිටියකු ලෙස සිතුව
පරහිතකාමි පොඩි පුතු වෙත ඇති සතුව
ඥගුණ සමුදාය ඇත දරුවකුගෙන් පැතුව

කරණම් ගසන මුත් රණ බිම අවි දැරුණු
අවිහිංසකයි පුත ඔබෙ සිත නැහැ දරුණු
එඩිතර වුවද සටනෙදි ගත සිත තුරුණු

හැකි නම් පණ දේවි සතුරන්ටත් මැරුණු

මෝටාරයක් පතිතව දෙපතුල ළඟට
ගැලවුණු මහිම තවමත් සිහිනයකි මට
දෙවියන් බුදුන් යදිමින් බෝ සෙවණ යට
මා හෙළු සුසුම් එන්නැති රැකවරණයට

ගිනි අවි මානගෙන තල් වැට මුවාවේ
ගල් මුල් කටු පඳුරු රළු වැලි තලාවේ
සෙල්ලම් පාන පුතු දැක දිවි තුලාවේ
පල්ලම් බසීවා කොටි මං මුලාවේ

අව්වේ තිබෙන රැස්මාලා අඩු වේවා
ගිනියම් කතර විල්ලුද පළසක් වේවා
බොන කර දියර දිව්‍යවිසඳයක් වේවා
මා ළඟ නැති පුතුට බඩගිනි නොදැනේවා

කටු වන ගහණ මැද බාදක ජය ගන්නයි
කළු ගල් පවුරු පෙරළා පෙරමුණ ගන්නයි
කොටි වග වලස් මැඩ සිහ නද පතුරන්නයි
සපුමල් යළිත් ඉතිහාසෙට එක් වන්නයි

පුණ්‍යා ජයලත්

නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය
ලක් හඬ FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ

රංජිත් රූබි සමඟ පැය තුනක්
විනෝදය සහ
නැවුම් ගීත සමගින්
සෑම ඉරිදාවකම
රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER